# නමකින් වැඩක් ඇත්ද?

# What's in a Name?

ඔබේ නම වැදගත්ද? ඇත්තෙන්ම ඔව්. ඔබේ පවුලේ සාමාජිකයන්ගෙන් ඔබ වෙනස් වී සිටින්නේ නම නිසාය. ඔබ විශේෂ තැනැත්තකු වී සිටින්නේද නම නිසාය. ඔබේ නම හඳුනා ගන්නට ඔබේ ළදරු කාළයේදීම පුළුවන් විය. එය ඔබේ මය. වෙනත් කෙනෙකුට එය දීමට ඔබ සූදානම් නැත. ඔබ යන හැම තැනකම ඔබේ නම ද යනනේය. ඔබ පාසලට ගිය විටද රැකියාවට ගිය විටද නිවසක් මිලට ගන්නා විටද කෙනෙක් ඔබෙන් පළමුවෙන්ම අසන්නේ "ඔබේ නම කුමක්ද?" යන්නයි. ඔබේ නම අන් සියලුම නම් වලට වඩා ඔබට වැදගත්ය. ඔබට එය අයිති නිසාත්, එය ඔබට වැදගත් වේ. ඔබේ නම හොඳ නමක් කර ගන්ට ඔබට පුළුවන්. ඔබේ නම නරක නමක් කර ගන්ටත් ඔබට පුළුවන්. ඔබේ නම ඔබමය. ඔබේ නම ඔබට වැදගත්සේම දෙවියන් වහන්සේගේ නම උන්වහන්සේට වැදගත්ය. උන්වහන්සේගේ නමින් නියෝජනය වන සියලු දේ දෙවියන්ය. දෙවියන් වහන්සේගේ නම කුමක්ද?

ආබ්‍රහම්තුමා දෙවියන් හඳුනා ගත්තේ යෙහෝවායිරෙ යනුවෙනි. දෙවියන් සියල්ල සපයන සේක යනු එහි අදහසයි. මෝසස්තුමා දෙවියන් හඳුනා ගත්තේ යෙහෝවා නිසී යනුවෙනි. මාගේ ධජය වන දෙවියන්වහන්සේ යනු එහි අදහසයි. ගිඩියෝන් තුමා දෙවියන් හඳුනා ගත්තේ යොහෝවා ආලොම් හෙවත් දෙවියන් සාමය දෙවු සේක යනුවෙනි. **(බයිබලයේ උප්පත්ති 22:14 නික්මයාම 17:15 විනිශ්චයකාරයා 6:24** කියවන්න) මේවායේ ඇති වචන පරිස්සමින් කියවා බැලුවහොත් ඒවා විශේෂණාත්මක පද බව තේරුම් යනවා ඇත. එහෙත් උන්වහන්සේගේ නම කුමක්ද?

මරියා නැමති තරුණිය අමතා දේවදූතයා ප්‍රකාශ කළේ උන්වහන්සේගේ නම "යේසුස්" බවය. "බලව නුඹ ගර්භණීව පුත්‍රයෙකු වදන්නීය. උන්වහස්සේට යේසුස් යන නාමය තබාපන්න." **(ලූක් 1:31)** ස්වර්ගීය නිවේදනයෙන් යෝසෙප්ට ලැබුනේද යේසුස් යන නමයි. "ඈ පුත්‍රයකු වදන්නීය. උන්වහන්සේට "යේසුස්" යන නාමය තබාපන්න මක්නිසාද තමන්ගේ සෙනග ඔවුන්ගේ පාප වලින් ගළවන්නේ උන්වහන්සේයයි කීවේය." **(මතෙව් 1:21)** දෙවියන්වහන්සේත් මේ නම ප්‍රකාශ කළ සේක. මෙය අනාගත වක්තෘ යෙසායාගේ අනාගත වාක්‍යය සම්පූර්ණ වීමක්ය. "මක්නිසාද අපට ළදරුවෙක් උපන්නේය අපට පුත්‍රයෙක් දෙනලද්දේය. ආණ්ඩුවද උන්වහන්සේගේ කර පිට තිබෙන්නේය. උන්වහන්සේගේ නාමය අපූර්වය මන්ත්‍රීවරයාය පරාක්‍රමවත් දෙවියන් වහන්සේය, සදාකාලික පියාණෝය. සමාදානයේ කුමාරයායි කියනු ලබන්නේය." **(යෙසායා 9:6)** මේ අසිරිමත් දරුවා සර්වබලධාරී දෙවියන්වහන්සේ ලෙසද සදාකාලික වූ පියාණන්වහන්සේ ලෙසද හඳුනාගත යුතු වූ නමුත් ඒ දරුවාට දුන් නම යේසුස්ය.

යේසුස් යන නාමයෙන් ප්‍රකාශ වන්නේ ශක්තිය (බලය) ආධිපත්‍යය හා දෙවියන්මය. යන අදහසයි. මේ නමේ ඇති ශක්තිය (බලය) කුමක්ද?

යේසුස් යන නාමයෙන් අප පාපයෙන් මුදවා ගනු ලැබේ. "වෙන කිසිවකු තුළ ගැළවීම නැත්තේය. මක්නිසාද අපේ ගැළවීමට අවශ්‍ය වූ මනුෂ්‍යයන් අතරේ දෙනලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේයයි කීවේය." **(ක්‍රියා 4:12)** යේසුස් යන නාමයෙන් අපට සදාකාලික ජීවනය ලැබේ.

"නමුත් මේවා ලියනලද්දේ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍ර වූ ක්‍රිස්තුස්වහන්සේ බව නුඹලා විශ්වාසකරන පිණිසත් විශ්වාසකොට උන්වහන්සේගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය." **(යොහාන් 20:31)**

යේසුස් යන නාමය අපගේ ශරීර සුවපත් කරනු ලැබේ.

උන්වහන්සේගේ නාමය කෙරෙහි ඇදහිල්ල කරණකොට ගෙන උන්වහන්සේගේ නාමයම නුඹලා දකින්නාවූ අඳුනන්නා වූ මේ මනුෂ්‍යයා සවිකළේය. **(ක්‍රියා 3:16)** යේසුස් යන නාමය අප යක්ෂයන්ගෙන් ගළවා ගනු ලැබේ.

එවිට පාවුල් අතිශයෙන් අප්‍රසන්නවී හැරී ආත්මයට කථාකොට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඇගෙන් අහක්වී යන්ට නුඹලාට අණකරමියි කීවේය. ඒ පැයේදීම ආත්මය අහක්ව ගියේය. **(ක්‍රියා 16:18)**

ස්වර්ගයෙත් මිහිපිටත් ඇති සියල්ල ඒ නමට අයත්ය.

"එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට සියලු නාම වලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කළේ ස්වර්ගයෙහිද පොළවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත් **(පිලිප්පි 2:9-10)** යේසුස් වහන්සේ ස්වර්ගයට එසවීමේදී උන් වහන්සේට අයත් වැඩ කොටස උන්වහන්සේ වෙනුවෙන් කරගෙන යාමට ගෝලයන්ට අවසර දුන් සේක.

"බලව මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසන තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක." **(ලූක් 24:49)** ක්‍රියා පොතේ දෙවන පරිච්ඡේදයේ ශුද්ධාත්මය බලය ගෝලයන් පිට සහ ඇදහිලි වතුන් පිට වැගිරීම සඳහන් වෙයි. යේසුස් වහන්සේගේ ආත්මය ලැබීමෙන් පසු ඔවුන් දෙවියන්වහන්සේගේ දරුවන් බවට පත්කරණු ලැබූහ.

පෙන්ත කොස්ත දිනයට පසුව යේසුස් වහන්සේගේ නමින් ගෝලයෝ දේශනා පැවැත්වූහ. (ලූක් **24:47, ක්‍රියා 4:12)** උන්වහන්සේගේ නමින් රෝගීන් සුවපත් කොට යක්ෂයින් පලවා හැරියහ. **(ක්‍රියා 3:6 , ක්‍රියා 16:18)** යේසුස් නමින් බව්තීස්ම කළහ. **(ක්‍රියා 8:16 - 10:48 - 19:5)**

අද දින යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නම භාවිතා කිරීමට අවසර ඇත්තේ කාහටද? දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ අද ලෝකයේ සිටිති. උන්වහන්සේගේ නම භාවිතා කිරීටම පුත්‍රයන්ට දෙන ලද අවසරය තවමත් එසේම පවතී. "අපි දෙවියන්වහන්සේගේ දරුවෝයයි ආත්මයාණන් වහන්සේම අපේ ආත්මය එක්ව සාක්ෂිදෙන සේක. තවද දරුවෝ නම් උරුමක්කාරයෝය. දෙවියන් වහන්සේගේ උරුමක්කාරයෝය. ක්‍රිස්තුස්වහන්සේ සමඟ හවුල් උරුමක්කාරයෝය. උන්වහන්සේ හා සමඟ මහිමය ලබන පිණිස උන්වහන්සේ සමඟ දුක් විඳිමු නම් මෙසේ වන්නේය. **(රෝම 8:16-17)** අද දින යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පනිවුඩය අප විශ්වාස කරන බැවින් අපගේ පාපයන් වෙනුවෙන් අපි පසුතැවිල්ලට පත් වෙමු. අපගේ අතීතය වලලාදමා ක්‍රිස්තුස්වහන්සේ සමඟ එක්වීමට ඇති අවශ්‍යතාව නිසා උන්වහන්සේගේ නමින් බව්තීස්ම ලබමු. උන්වහන්සේගේ ජීවිතය අපට දීමට උන්වහන්සේ සූදානම් නිසා ද අප උන්වහන්සේගේ පුත්‍රයන් බවට පත්වීමට කැමති නිසාද උන්වහන්සේගේ ශුද්ධාත්මයෙන් අප පුරවාලන සේක. දෙවියන් වහන්සේගේ කැමැත්ත වනුයේ ද තමන් වහන්සේගේ නාමය ඔබ වෙත පිහිටුවීමයි. "නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහගන්නෝද ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක." **(යොහාන් 1:12)**

## ඔබටද උන්වහන්සේගේ අසිරිමත් නාමයේ උරුමක්කාරයකු විය හැකිය.

## You Too Can be an Heir of His Wonderful Name.

**එක්සත් පෙන්ත කොස්ත සභාව,**
**නො. 1 ටෙම්ප්ලර් පෙදෙස, ගල්කිස්ස.**
**දුරකථන : 712615 , 716951**

Apostolische Pfingstgemeinde Mannheim
Friedelsheimerstr. 18-20
D - 68199 Mannheim (Neckarau) /Germany
Pastor Raymond Wey
Assistent Pastor Sascha Wey
www.jesus-is-god.de, www.v-p-m.de